# ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

## දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය

## කළමනාකරණ අධ්‍යයන පීඨය

# ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

## XI කණ්ඩායම (2024)

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය කළමනාකරණ අධ්‍යයන පීඨය මඟින් පිරිනමනු ලබන ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට ලියාපදිංචි වීම සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් :**

- ඕනෑම විෂය ධාරාවකින් එකවරක දී අ.පො.ස.(උ/පෙළ) විභාගය විෂයන් 03කින් සමත් වීම හෝ
- NVQF අදියර 4 සමත් වීම හෝ කළමනාකරණ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම් හෝ
- විශ්වවිද්‍යාලයීය සනාථන සභාව මඟින් අනුමත වෙනත් සුදුසුකම්

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | : | වසර 03 (සාමාසික 06) |
| මාධ්‍යය | : | සිංහල හෝ ඉංග්‍රීසි |
| අයදුම්පත් ගාස්තු | : | රු. 1, 500.00 |

<u>පාඨමාලා ගාස්තු</u>

| | | |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | : | රු. 1, 500.00 - එක් වසරක් සඳහා |
| විභාග ගාස්තු | : | රු. 3, 500.00 - එක් සාමාසිකයක් සඳහා |
| පාඨමාලා ගාස්තුව | : | රු. 25, 650.00 - එක් සාමාසිකයක් සඳහා |

**දේශන ක්‍රමවේදය**

**සිංහල මාධ්‍යය**

සති අන්තයේ විශ්වවිද්‍යාලය මඟින් සම්මන්ත්‍රණ සැසි පවත්වනු ලැබේ

**ඉංග්‍රීසි මාධ්‍යය**

Zoom තාක්ෂණය මඟින්

**අධ්‍යයන මධ්‍යස්ථාන**

මිහින්තලේ, කුරුණෑගල, මහනුවර, පොළොන්නරුව

**අයදුම් කළයුතු ආකාරය**

අයදුම්පත්‍රය හා අදාළ තොරතුරු ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවිය වන http://cdce.rjt.ac.lk/cdce/ මඟින් බාගත කළ හැකි අතර නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සහ සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්, ජාතික හැඳුනුම්පතේ පිටපතක්, අ.පො.ස.(උ/පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් ද සමඟින් අයදුම්පත් ගාස්තු තැන්පතු බැංකු පත්‍රිකාව (අයදුම්පත් ගාස්තුව වන රු. 1500.00 ක මුදල, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මහජන බැංකුව, අනුරාධපුර ශාඛාවේ ගිණුම් අංක 008-1001-80000010 බැර කිරීමෙන් පසු) (ඕනෑම මහජන බැංකු ශාඛාවක් මඟින් ගෙවීම් කිරීම සිදුකළ හැක) 2024.11.01 දිනට පෙර ලියාපදිංචි තැපැල් මඟින් නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, බුලන්කුලම දිසා මාවත, අනුරාධපුර යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍රය සමඟ https://forms.gle/nmJfMb7b1J16LHmE8 මඟින් දක්වා ඇති (Google Form) පෝරමය සම්පූර්ණ කිරීම ද අනිවාර්ය වේ.

**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2024 නොවැම්බර් මස 01 වන දින**

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ
06.10.2024

විමසීම්
නියෝජ්‍ය ලේඛකාධිකාරී (CDCE)
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය
Email: cdcesar@rjt.ac.lk 025 2260220

ශිෂ්‍යයන් බඳවා ගැනීමේ ක්‍රමවේදය - අ.පො.ස (උ/පෙළ) විභාග Z අගය සහ /හෝ තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණය සහ /හෝ තෝරාගැනීමේ පරීක්ෂණය මගින්

tamilguru.lk